ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

Article 12(1)

| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2013-02-21 |
|---|---|---|

පැමිණිලිකරු : ඒ.ඩී කරුණාතිලක මයා,
ඇල්ලමුල්ල,
හොරවල, වැලිපැන්න.

වගඋත්තරකරුවන් : පළාත් අධ්‍යාපන ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය (බ.ප)
ශ්‍රාවස්ථි මන්දිරය,
කොළඹ 07

පැමිණිලි අංකය : **HRC/4071/13**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තමා 1988.11.03 වන දින සිට හොරවල නවෝද්‍යා විදුහලේ සහන මුරකරුවෙකු වශයෙන් සේවයේ යෙදී සිට ඇති බවත්, ඉන් පසුව 1999.05.11 දින බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙතින් සේවය යොදවා ගත් දිනයේ සිට සහන මුරකරු ආදේශක තනතුරට පත්කර ඇති බවත්ය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2006 සහ 2006.12.06 දිනැති චක්‍රලේඛනයට අනුව 2006.11.01 දිනට වැඩ කරන දින 180 ක් සතුටුදායක ලෙස හා අඛණ්ඩ ලෙස සේවය කිරීම මත තනතුර ස්ථිර කිරීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ බවත් තමා මෙම සම්මුඛ පරීක්ෂණයට සියලු සුදුසුකම් සපුරා ඉදිරිපත් වූ නමුත් 2008.06.30 වන දිනට වයස අවුරුදු 45යි දින 06ක් වී තිබීම හේතුවෙන් සේවය ස්ථිර නොකළ බවත් දක්වා ඇත. තමාගේ පත්වීම් ලිපියේ දිනය 1998.11.03 වෙනුවට 1998.11.13 ලෙස වැරදියට සටහන් කිරීම නිසා පත්වීම් ලබා දී ඇති දිනට වයස 45ට වැඩි ලෙසට නිරීක්ෂණය වීම මත (අවු 45 දින 6) එම කාරණය සලකා බලා තමා වෙත පත්වීම් ලබා දී නොමැති බවද දක්වා ඇත. තමා ඒ පිළිබඳව අභියාචනා කළද කිසිදු සහනයක් නොලැබුනු බවත් ඒ අනුව තමා එම තනතුර සඳහා සියළු සුදුසුකම් සපුරා තිබියදී එය ලබා නොදීම තුළින් වගඋත්තර පාර්ශවය තමාට අගතියක් කළ බව පැමිණිල්ලෙන් දක්වා ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165,කිංසි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
දුරකථන / தொலைபேசி / Telephone: 94 - 11 - 2694925, 2685980, 2685981
සභාපති / தவிசாளர் / Chairman: 011-2696470
ලේකම් / செயலாளர் / Secretary: 011-2689558
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2696470
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2689558, 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-

පැමිණිලිකරු 1999.05.11 වන දිනැති ලිපියකින් බප/මතු හොරවල නවෝද්‍යා මහා විද්‍යාලයේ සහන මුරකරුවෙකු ලෙස ආදේශක පදනම මත පත්කළ බවත් "උක්ත පදනම මත සේවයේ යොදාගත් දින සිට පත් කිරීමට කටයුතු කරන බවට" එම ලබාදුන් ලිපියෙන් වැඩිදුරටත් සඳහන් කර ඇති බවත් දක්වා ඇත. පැමිණිලිකරු 1998.11.03 වන දින සිට උක්ත විදුහලේ සහන මුරකරු ලෙස සේවයට වාර්තා කර ඇති බව විදුහල්පති විසින් එවන ලද ලොග් සටහනේ සඳහන් වී ඇති බවද දක්වා ඇත.

රාජ්‍ය ආයතන සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වල තාවකාලික. අනියම්. ආදේශක. කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවා ගත් සේවකයන් ස්ථිර කිරීම සඳහා නිකුත් කරන ලද 2008.07.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2006(iv) අනුව මුරකරුවන් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කර බැලීමට පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට උක්ත පැමිණිලිකරු කැඳවා ඇති අතර එකී සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ලේඛනයේ. පැමිණිලිකරු පත්වීම භාරගත් දිනය ලෙස සටහන් වනුයේ 1998.11.03 දින නොව 1998.11.13 දින ලෙසට වන බවද දක්වා ඇත. ඒ අනුව නිර්දේශය යන තීරුවේ පත්වීම් ලබා දී ඇති දිනට පැමිණිලිකරුගේ වයස අවුරුදු 45 යි දින 6ක් ලෙසට සටහන් කර ඇති බවද දක්වා ඇත. එබැවින් පැමිණිලිකරුගේ වයස අවුරුදු 45 යි දින 06 ක් වූ නිසා 45ට වැඩි සීමාව මත පැමිණිලිකරුට පත්වීම් ලබා දි නොමැති බවත් රාජ්‍ය ආයතන සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වල තාවකාලික. අනියම්. ආදේශක. කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවා ගත් සේවකයන් ස්ථිර කිරීම සඳහා නිකුත්කරන ලද 2006.12.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2006 හි (v) ප්‍රතිපාදන අනුව පැමිණිලිකරුට සේවය ස්ථිර කිරීමේ හැකියාව තිබී ඇති බවත් නමුත් 2013.11.07 දිනට මොහුට වයස අවුරුදු 60 සම්පූර්ණ වී ඇති බැවින් දැනට සේවය අවසන් කොට ඇති බවද වැඩිදුරටත් දක්වා ඇත.

නිරීක්ෂණ හා නිගමනය :-

පැමිණිලිකරු ඉදිරිපත් කර ඇති පැමිණිල්ල සම්බන්ධව අවධානය යොමු කිරීමේදී පැමිණිලිකරු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2006(iv) හි ප්‍රතිපාදන අනුව සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ 2008.07.30 දිනට පැමිණිලිකරු සියළු සුදුසුකම් සපුරා ඇති බව වගඋත්තර පාර්ශවය 2014.12.30 දාතම වාර්තාව අනුව ලිඛිතවම පිළිගෙන ඇත.

එහිදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පත්වීම් භාරගත් දිනය 1998.11.03 දින ලෙස නොව. 1998.11.13 ලෙසට වැරදි ආකාරයෙන් සටහන් කිරීම නිසා පැමිණිලිකරුගේ වයස අවුරුදු 45 ට වඩා වැඩි ලෙසට නිරීක්ෂණය වී ඇත. නමුත් නිවැරදි දිනය ලෙස 1998.11.03 දිනය සටහන් වූයේ නම් පැමිණිලිකරුට අවුරුදු 45 ට අඩු වයස් සීමාව යටතේ අනෙකුත් සදුසුකම් සපුරා තිබීම මත පත්වීමක් ලැබීමට හැකියාව තිබූ බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. ඒ අනුව පැමිණිලිකරු නිසි සුදුසුකම් සපුරා තිබියදීත් වගඋත්තර පාර්ශවයේ නොසැළකිලිමත් ක්‍රියාව හේතුවෙන් පැමිණිලිකරුට අදාළ පත්වීම ලැබී නොමැති බව නිරීක්ෂණය වේ. එසේම. පැමිණිලිකරු අවස්ථා කිහිපයකදී මේ පිළිබඳව අදාළ

බලධාරීන් වෙත අභියාචනා ඉදිරිපත් කර ඇතත් ඒ පිළිබඳව නිසි ක්‍රියාමාර්ග ගෙන නොමැති බවද නිරීක්ෂණය වී ඇත. එසේම මේ වන විට එනම් 2013.11.07 වන දින පැමිණිලිකරුට වයස අවුරුදු 60 සම්පූර්ණ වීම නිසා සේවය අවසන් කොට ඇත.

මෙකී සමස්ථ කරුණු දෙස අවධානය යොමු කිරීමේදී වගඋත්තර පාර්ශවයේ නොසැලකිලිමත් ක්‍රියාකලාපය හේතුවෙන් පැමිණිලිකරු වෙත අදාළ තනතුර ලැබීමට තිබූ අවස්ථාව අහිමි වීම මඟින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

> රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2006(V) ප්‍රතිපාදන මත පැමිණිලිකරු හට ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීමක් ලබා ගැනීමට අවස්ථාවක් පවතින බව නිරීක්ෂණය වන හෙයින්. එකී චක්‍රලේඛනයේ විධිවිධාන පරිදි පැමිණිලිකරු වෙත 2008.07.30 දාතම සම්මුඛ පරීක්ෂණය අනුව පත්වීම් ලබා දීම් සිදුකළ දිනසිට සථිර පත්වීමක් ලබා දෙන ලෙසට වගඋත්තර පාර්ශවය වෙත නිර්දේශ කරනු ලැබේ.

2018.03.31 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.